# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2022 ජූනි

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දුරකථනය: **011-2147414** ෆැක්ස්: **011-2877945** ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2022 ජූනි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 58.9%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2022 මැයි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 45.3%ක් ලෙස වාර්තා විය. 2022 ජූනි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 36.0%ක හා ආහාර නොවන කාණ්ඩයේ 22.9%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2021 ජූනි මාසයේ 6.1%ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 4.5%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 1.6%ක් විය. 2021 ජූනි මාසයට සාපේක්ෂව 2022 ජූනි මාසයේ උද්ධමනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාර හා ආහාර නොවන කාණ්ඩවල පැවති ඉහළ මිල මට්ටම් ය. ඒ අනුව, ආහාර කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය) 2022 මැයි මාසයේදී 58.0% සිට 2022 ජූනි මාසයේදී 75.8% දක්වා වැඩි වූ අතර, ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය) 2022 මැයි මාසයේදී 34.2% සිට 2022 ජූනි මාසයේදී 43.6% දක්වා වැඩි විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2022 මැයි මාසයේ 208.7ක් වූ දර්ශකාංකය 2022 ජූනි මාසයේ 231.5ක් දක්වා වැඩිවීමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2022 ජූනි මාසයේ දර්ශකාංකය 22.8ක වැඩිවීමක් එනම් 10.9ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 7.2%කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 3.7%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැලකූවිට සහල්, එළවළු, අළුත් මාළු, සීනි, කිරිපිටි, කරවල, මයිසූර් පරිප්පු, කුකුළුමස්, පාන්, බිත්තර, මිරිස්කුඩු, අර්තාපල්, බිස්කට් වර්ග, ළදරු කිරිපිටි, ටින්මාළු, වියළි මිරිස්, තිරිඟු පිටි, රතුළූණු, ලොකුළූණු, අමුමිරිස්, තුනපහ කුඩු, තේකොළ/කුඩු, බනිස්, පළතුරු, නූඩ්ල්ස්, සුදුළූණු, සෝයාමීට්, හරක්මස් සහ කඩල යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත. තවද පොල්තෙල් මිලෙහි අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2022 ජූනි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' *(අරක්කු)*, 'රෙදිපිළි හා පාවහන්', 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' *(ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය, LP ගෑස් සහ දර මිලදී ගැනීම)*, 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' *(සබන් වර්ග)*, 'සෞඛ්‍ය', 'ප්‍රවාහන' *(පෙට්‍රල්, ඩීසල් සහ බස් ගාස්තු)*, 'සන්නිවේදන' (ජංගම *දුරකථන ගාස්තු*), 'විනෝදාත්මක හා සංස්කෘතික' (පොත්, *පත්තර මිල*), 'ආපනශාලා සහ හෝටල්' සහ 'විවිධ භාණ්ඩ හා සේවා' (*සුවඳ සබන් වර්ග, මෝටර් වාහන රක්ෂණ ගාස්තු*) යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට 'අධ්‍යාපන' කාණ්ඩයේ දර්ශක අගය වෙනසක් වී නොමැත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2022 මැයි මාසයේ 37.7% සිට 2022 ජූනි මාසයේ 49.3% දක්වා වැඩිවීමක් වාර්තා විය.

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම: 2013=100), ජාතික පාරිභෝගික මිල දර්ශකය (යටිදැරි), ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සහ ලක්ෂ්‍යමය යටිදැරි උද්ධමනයේ විචලනය




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| **2021** | ජූනි | 145.7 | 157.3 | 136.5 | 144.6 | 1.5 | 0.6 | 6.1 | 9.8 | 2.9 | 4.1 |
| | ජූලි | 146.6 | 158.5 | 137.2 | 145.6 | 0.6 | 0.7 | 6.8 | 11.0 | 3.2 | 4.4 |
| | අගෝ. | 147.1 | 159.4 | 137.4 | 146.5 | 0.3 | 0.6 | 6.7 | 11.1 | 3.0 | 4.7 |
| | සැප්. | 147.5 | 159.6 | 137.9 | 147.2 | 0.3 | 0.5 | 6.2 | 10.0 | 3.0 | 4.8 |
| | ඔක්. | 150.6 | 162.6 | 141.2 | 150.6 | 2.1 | 2.3 | 8.3 | 11.7 | 5.4 | 7.2 |
| | නොවැ. | 155.3 | 171.5 | 142.6 | 153.0 | 3.1 | 1.6 | 11.1 | 16.9 | 6.2 | 8.8 |
| | දෙසැ. | 161.0 | 182.1 | 144.5 | 155.7 | 3.7 | 1.8 | 14.0 | 21.5 | 7.6 | 10.8 |
| **2022** | ජන. | 166.0 | 188.3 | 148.4 | 159.2 | 3.1 | 2.2 | 16.8 | 24.4 | 10.2 | 12.9 |
| | පෙබ. | 167.8 | 190.6 | 149.8 | 161.2 | 1.1 | 1.3 | 17.5 | 24.7 | 11.0 | 14.1 |
| | මාර්තු | 172.7 | 195.2 | 154.9 | 166.3 | 2.9 | 3.2 | 21.5 | 29.5 | 14.5 | 17.3 |
| | අප්‍රේල් | 190.3 | 218.8 | 167.9 | 182.3 | 10.2 | 9.6 | 33.8 | 45.1 | 23.9 | 27.9 |
| | මැයි | 208.7 | 242.2 | 182.4 | 197.9 | 9.7 | 8.6 | 45.3 | 58.0 | 34.2 | 37.7 |
| | ජූනි | 231.5 | 276.6 | 196.0 | 215.9 | 10.9 | 9.1 | 58.9 | 75.8 | 43.6 | 49.3 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව